**යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2019**

**--------------------------------------------------------------------------------**

යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 (අ) වගන්තිය සහ අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, උතුරු පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ උතුරු පළාතේ පළාත් පාලන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන් සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ යාපනය අර්ධද්වීපයේ ජල සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සංරචක යටතේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,474.59 කට සමාන එජඩො මිලියන 147.45 ක් විය. ඉන් රු.මිලියන 8,541.76 කට සමාන එජඩො මිලියන 76.45 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර රු.මිලියන 5,363.04 කට සමාන එජඩො මිලියන 48 ක් මූල්‍යනය කිරීමට ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (Agence Francaise de Development) එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 2,569.79 කට සමාන එජඩො මිලියන 23 ශ්‍රී ලංකා රජය මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 පෙබරවාරි 15 දින ආරම්භ කරන ලද අතර 2017 අගෝස්තු 14 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද රු.මිලියන 315.45 ක් වූ පොළී ගාස්තු හා රු.මිලියන 31.32 ක් වූ බැදීම් ගාස්තු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන උපයෝජන අව ප්‍රමාණය වේ. | ඒඩීබී හි මූල්‍යනය සඳහා වන බැදීම් හා පොළී ගාස්තු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2019 වර්ෂය සඳහා වූ පොත් හා වාර්තාවල ද වියදමක් ලෙස ගිණුම්ගත වන බැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත මෙම පොළී හා බැදීම් ගාස්තු ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස ගිණුම්ගත කර නැත. | සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ සමස්ත උපයෝජනය නිරූපණය වන පරිදි අදාල වියදම් ගිණුම්වලට ගත යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදනය කරන ලද පිළිවෙලින් රු.මිලියන 16.44 ක් හා රු.මිලියන 25.30 ක් වූ මෝටර් රථ සහ බර වාහන සිවිල් වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් අව ප්‍රමාණය වන අතර සිවිල් වැඩ වටිනාකම අධි ප්‍රමාණය වේ. | මෙකී වාහන ටීඩබ් ටීඑම් 1 සහ ටීඩබ් ටීඑම් 2 යන සිවිල් වැඩ කොන්ත්‍රාත් පැකේජ් හරහා මිලදී ගත් බැවින් 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෙම මිලදී ගැනීම් සිවිල් වැඩ යටතේ දක්වන ලදී. කෙසේ වුවද, මෙම මිලදී ගැනීම් සිවිල් වැඩ වර්ගීකරණයෙන් වාහන වර්ගීකරණයට මාරු කරන බවට ව්‍යාපෘතිය සහතික වන අතර එය 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙනු ඇත. | වත්කම්වල විවිධ ආයුකාලයන් පදනම් කොට ගෙන ජංගම නොවන වත්කම් හඳුනාගත යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසි සමග අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) ෆිඩික් මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 14.8 සාමාන්‍ය කොන්දේසි අනුව සහතික කරන ලද බිලක් දින 56 ක් ඇතුළත නිරවුල් කළ යුතුය. කෙසේ වුවද, 2019 දෙසැම්බර් 31 දිනට බිලෙහි දේශිය කොටස ගෙවීම ප්‍රමාද වීම මත ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 6.83 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | ෆිඩික් මාර්ගෝපදේශ සංග්‍රහය උල්ලංඝනය කිරීම නිසා අතිරේක වියදම් දැරීමට විය හැක. | ව්‍යාපෘතියේ මුල් ණය මූල්‍යන විධිවිධාන අනුව, කොන්ත්‍රාත් අතරමැදි ගෙවීම් බිල්පතේ ගෙවිය යුතු මුළු වටිනාකමෙන් සියයට 78 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් ද ඉතිරි සියයට 22 දේශීය අර මුදලින් ද ගෙවිය යුතු වේ. සියළු දෙනා දන්නා පරිදි, 2019 වර්ෂයේ දේශීය අරමුදල් නොමැති වීම නිසා ව්‍යාපෘතියට කොන්ත්‍රාත්කරුගේ නිරවුල් නොවූ දේශීය අරමුදල් කොටස ගෙවීමට නොහැකි විය. 2020 ජූලි වන විට දේශීය අර මුදල් ලැබීම නිසා සියළු හිඟ බිල්පත්‍ර 2020 ජූලි 28 දින නිරවුල් කරන ලදි.<br><br>කෙසේ වුව ද, කොන්ත්‍රාත් ගිවිසුමෙ 14.8 හි ප්‍රමාද ගෙවීම් සඳහා වන කොන්දේසි අනුව ආසියානු සංවර්ධන බැංකුවෙන් කළ යුතු ගෙවීම් සඳහා මුදල් නියමිත වේලාවට ලැබෙන නිසා දේශීය අරමුදලින් කළ යුතු වියදම් ප්‍රමාදය සඳහා පමණක් කොන්ත්‍රාත්කරු පොළී ගාස්තු අය කරන ලදී. | ප්‍රමාද ගෙවීම්වලින් වැලකීම සඳහා ගෙවීම් නියමිත කාලය තුළ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද 8.13.4 සහ 2012 අගෝස්තු 07 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 02/2012 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 10 ඉක්මවා විචල්‍යතාවයන් පැන නගින බව පෙනී යන අවස්ථාවන්හිදී හෝ අනුමත විෂය පථය වෙනස් වීමේදී හෝ ඊට අදාල | ව්‍යාපෘති පිරිවැය අනපේක්ෂිත ලෙස ඉහළ යා හැක. | ප්‍රමාණ විචලන හා විෂය පථය වෙනස්වීම් ඒ ඒ කොන්ත්‍රාත්වල හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන තුළ කළමනාකරණය කර ගැනීමට ව්‍යාපෘතිය නිරතුරුව සෑම උත්සාහයක්ම දරයි. කොන්ත්‍රාත් විචලනය හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්ම වන විට, අදාල අධිකාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය නියමිත කාල සීමාව තුළ ලබා ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කරයි. | අතරමැදි ගෙවීම් සහතිකපත් තුළ අනුමත විචලනයන් පමණක් ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| පිරිවැය ඇස්තමේන්තු සංශෝධන යෝජනා සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සහ නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ආකෘතිය, ජල සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ ද සමග පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂවරයා වෙත එවිය යුතු වේ. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් අංක පීඊඅයිසී/ජේකේඩබ්එස්එස්පී ටීඩබ්ටීඑම්/ 2014/02 සම්බන්ධයෙන් ඉහත රෙගුලාසි අනුගමනය කර නොතිබුණි. | | කෙසේ වුවද, කොන්ත්‍රාත් ක්‍රියාත්මක කාල සීමාව තුළ, සාමාන්‍යයෙන් බොහෝ ප්‍රධාන කොන්ත්‍රාත්තුවල විෂය පථය වෙනස්වීම හා වැඩ බිමේ තත්ත්වයන් මත විචලන, ඉතිරිවීම් හා අත් හැරීම් ඇති වේ. පානීය ජල මූලාශ්‍රය ඉරණමඩු වැවේ සිට තල්යාඩි ප්‍රදේශයේ මුහුදු ජලය පරිවර්තිය අවශෝෂණ පිරියත ලෙසට විෂය පථය වෙනස් කිරීම නිසා ශ්‍රී ලංකා රුපියල් 242,507,258 ක් වූ චාවකච්චේරි හන්දියේ සිට පූනරි ජල ගබඩාව දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ නල එලීම් කාර්යය අත් හැරීමට සිදුවීම පීඊඅයිසී/ජේකේඩබ්ජ්ස්ජ්ස්පී ටීඩබ්ටීඑම්/ 2014/02 කොන්ත්‍රාත්තුවේ, ප්‍රධාන අත්හැරීම්වලට හේතු පාදක විය. විෂය පථය වෙනස් කිරීම සඳහා ව්‍යාපෘති ඇගයීම් කමිටුවේ මෙන්ම ආසියානු සංවර්ධන බැංකුවේ ද අනුමැතිය ලබා ගන්නා ලදී. මෙම විෂය පථය වෙනස්වීමට පිළියමක් ලෙස පරන්තන් සිට පූනරි දක්වා සම්ප්‍රේෂණ නල ක්‍රියාත්මක කළ අතර එය විචලනය ලෙස සලකන ලදී. | |
| (ඇ) 2018 අගෝස්තු 05 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ලිපි අංක බීඩී/අයිඩීඅයි 166/08/වීර්ජ්න් -ටීර්ජ්ම් අනුව අවම මිල සීමාව වූ රු.මිලියන 42.00 තුළ ඩබල් කැබ් රථ 02ක්,බැකෝ යන්ත්‍රයක් සහ බූම් ක්රේන් ට්‍රක් රථයක් මිලදී ගැනීම සඳහා ව්‍යාපෘතිය අනුමැතිය ලබා ගෙන තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් රු.මිලියන 3.03 ක් වූ අතිරේක ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඉහත වාහන මිලදී ගැනීම සඳහා රු.මිලියන 45.03 ක් වැය කර තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛය උල්ලංඝනය කිරීම ව්‍යාපෘති කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපායි. | වාහන මිලදී ගැනීම සඳහා 2018 මැයි මස යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ අනුමැතිය ඉල්ලා තිබුණි. ජල සම්පාදන අමාත්‍යාංශය විසින් 2018 අගෝස්තු 13 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසා වාහන මිලදී ගැනීම් පිළිවෙලින් 2018 වසර අගභාගයේ හා 2019 වසර මුල් භාගයේ සිදු කරන ලදී. අනුමැතිය ලද දින සිට මිලදී ගැනීම් සිදු කළ දින දක්වා වූ කාලය තුළ විදේශ විනිමය හුවමාරු අනුපාතයේ සිදු වූ සැලකිය යුතු උච්චාවචනයන් නිසා වාහන වල වෙළඳපල මිල ඉහළ යන ලදී. මෙම වාහන තරඟකාරී ලංසු කැඳවීම් ක්‍රියාවලිය යටතේ එදිනට පැවති වෙළඳපල මිල යටතේ මිලදී ගන්නා ලදී. | අතිරේක ගෙවීම සඳහා ව්‍යාපෘතිය විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |

**3.** **භෞතික කාර්ය සාධනය**

**3.1** **ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය**

| කාර්යය | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත | සත්‍ය | | | |
| (අ) පූමාවෙලි, කරවෙඩි,නයිනතිවු අනලතිවු හා එලුවයිතිවු වල ජල කුළුණු ඉදි කිරීම | ජල කුළුණු 05 | සියයට 10 | යාපන අර්ධද්වීපයට ආරක්ෂිත පානීය ජලය සැපයීම ප්‍රමාද වීම. | 2019 මැයි 28 දින ප්‍රදානය කළ කොන්ත්‍රාත්තුවේ වැඩ 2019 ජුලි 02 දින ආරම්භ කළ අතර වැඩ නිම කිරීමට සැලසුම් කළ මුල් දිනය 2020 දෙසැම්බර් 22 වේ. (දින 540). 2019 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 10ක් සහ සංචලන අත්තිකාරම් ඇතුලත්ව මූල්‍ය ප්‍රගතිය සියයට 19ක් විය. 2020 සැප්තැම්බර් 30 දිනට වර්තමාන භෞතික ප්‍රගතිය සියයට 33 ක් සහ 2020 සැප්තැම්බර් 30 දිනට මූල්‍ය ප්‍රගතිය සියයට 40ක් වේ. කෙසේ වුවද, සැලසුම් කරන ලද කාල රාමුව ඇතුළත කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ, සම්බන්ධීකරණ හා ක්‍රියාත්මක ඒකකය සහ මණ්ඩලයේ ජල සම්පාදන ව්‍යාපෘති ඒකකය, එහි ප්‍රගතිය සමීපව අධීක්ෂණය කරයි. | කොන්ත්‍රාත් කාර්යය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) පලෙයි, කොඩිකාමම්, මීසාලේ, පූන්කරි, පුත්තූර්, නාවත්කුලි, කරෙයිනගර්හි බෙදාහැරීම් නල එලීම | කි.මී. 250 | කි.මී 110 | නිම කිරීමේ ප්‍රමාදය මත සම්බන්ධිත පිරිවැය ඉහළ යනු ඇත. | නියමිත කාලය තුළ කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණය, සම්බන්ධීකරණ හා ක්‍රියාත්මක ඒකකය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල සම්පාදන ව්‍යාපෘති ඒකකය කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සමීපව අධික්ෂණය කරයි. ගෝලීය කොවිඩ් 19 වසංගත තත්ත්වය තිබියදීත් කොන්ත්‍රාත්තකරු විසින් 2020 සැප්තැම්බර් 30 දින වන විට කි.මී 170ක දුර ප්‍රමාණයක නල එලීම් නිම කර | කොන්ත්‍රාත් කාර්යය කඩිනම් කිරීමට පියවර ගත යුතුය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින් කාර්යය කඩිනම් කිරීම සඳහා වැඩ කරන පිරිස දෙගුණයක් කර තිබේ. ගෝලීය කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා කොන්ත්‍රාත්තුව 2021 මාර්තු අග වන විට නිම කිරීමට බලාපොරොත්තු වේ. | |
| (ඇ) යාපනය නගර ප්‍රදේශයේ බෙදා හැරීම් නල එලීම. | කි.මී.283 | නැත | ඉදිකිරීම් ප්‍රමාදවීම ව්‍යාපෘතියේ අරමුණ කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැක. | යාපනය නගර ප්‍රදේශයේ සම්ප්‍රේෂණ නල සැපයීම හා එලීම සඳහා වන කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල සංදේශය 2020 ජුනි 15 දින ඉදිරිපත් කරන ලදි. ව්‍යාපෘතිය මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.මෙම වර්ෂය අවසානයේ ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ. | 2020 දෙසැම්බර් 31 ණය අවසන් වන නිසා ව්‍යාපෘති කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) චුන්නාකම්හි ජල සැපයුම් යෝජනා ක්‍රම ඉදි කිරීම | කි.මී.50 | නැත | යාපනය අර්ධද්වීපයට ආරක්ෂිත පානීය ජලය සැපයීම ප්‍රමාද වේ. | මුහුදු ජලය පරිවර්තිත අවශෝෂණ පිරියත ප්‍රදානය කල පසු, චුන්නාකම් ජල සැපයුම් යෝජනා ක්‍රමයේ කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා අරමුදල් ප්‍රමාණවත් ද යන්න තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම ටෙන්ඩර දැන්වීම් පළ කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වන ලදී. | ව්‍යාපෘති කාර්ය කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) ව්‍යාපෘතියේ සංශෝධිත විෂය පථය අනුව, යාපනය කිලිනොච්චි ප්‍රදේශයට ජලය සැපයීම සඳහා ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් කරන ලද මුහුදු ජලය ප්‍රතිවර්තිත අවශෝෂණ පිරියත සඳහා ඉදි කරන ලද ජල කුළුණු 2022 වන විට නිම | තල්යාඩි හි මුහුදු ජලය ප්‍රතිවර්තිත අවශෝෂණ පිරියත ඉදි කරන තෙක් සියළු ඉදි කිරීම් නිශ්කාර්යව පවතින අතර යාපනය අර්ධද්වීපයට ආරක්ෂිත පානීය ජලය සැපයීම ප්‍රමාද වේ. | මරුතන්කෙනි, තල්යාඩි මුහුදු ජලය ප්‍රතිවර්තිත අවශෝෂණ පිරියත ඉදිකිරීම ලෙස ප්‍රධාන විෂය පථය වෙනස්වීම සඳහා පහසුකම් සැලසීමට 2017 දෙසැම්බර් ණය ගිවිසුම් අත්සන් කරන ලදී. ව්‍යාපෘතියේ අරමුණ ඉටු කර ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එජඩො මිලියන 120 ක් හා ශ්‍රී ලංකා රජය එජඩො මිලියන 33ක් ලෙස එකතුව එජඩො මිලියන 153 ක් ව්‍යාපෘතියට මූල්‍යනය කරන ලදී. ව්‍යාපෘතියේ 2017 නොවැම්බර් | ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද ඉදි කිරීම් අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| කිරීමට අපේක්ෂිත ය. එම නිසා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,140 කට ප්‍රදානය කරන ලද ජල කුළුණු 15 ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව සහ ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 5,536 කට ප්‍රදානය කරන ලද නල එලීම් 2018 දෙසැම්බර් 31 වන විට නිම කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද මෙම සියළු ඉදි කිරීම්, නිසි ජල මූලාශ්‍රයක් නොමැති වීමෙන් වර්ෂයකට වැඩි කාලයක සිට නිශ්කාර්යව පවතී. | | පරිපාලන අත්පොතෙහි විස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුව පරිදි තල්යාඩිහි මුහුදු ජලය ප්‍රතිවර්ත්‍ය අවශෝෂණ පිරියත සඳහා ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 70ක් වූ අතර එම කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් ප්‍රදානය කිරීමටත් 2020 ජුනි අවසන් කිරීමටත් මූලිකව සැලසුම් කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය හේතුවෙන් ආසන්න ලෙස දින 1109 ක් දැනටමත් ගත වී ඇති මුහුදු ජලය පරිවර්ත්‍ය අවශෝෂණ පිරියත ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ඒඩීබී එල් 3603 - එස්ආර්අයි අතිරේක ණය යටතේ මෙතෙක් ප්‍රදානය කර නැත.<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ අවශෝෂණ පිරියත සැලසුම් කිරීම ඉදි කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රථම ප්‍රසම්පාදනය මෙය වේ. එම නිසා අවම පිරිවැය ඇගයීමක් සහිත ලංසුකරු තෝරා ගැනීම සඳහා ලංසුකරුවන්ගේ, මහ බැංකුවේ මෙන්ම අමාත්‍ය මණ්ඩල පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ හා අසියානු සංවර්ධන බැංකුවේ පැහැදිලි කිරීම් මාලාවක් අවශ්‍යවේ.<br><br>මෙයට අමතරව, ප්‍රතික්ෂේපිත දෙවන ලංසුකරු විසින් කරන ලද අභියාචනය 2020 පෙබරවාරි 19 සලකා බැලූ අතර අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. 2020 මැයි 28 දින පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2020 ජූලි මස ඉදිරිපත් කළ අතර කොන්ත්‍රාත්තුව 2020 වර්ෂය අවසානයේ ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. | |
| (ආ) ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 2,646 කට 2016 වර්ෂයේ ප්‍රදානය කරන ලද ප්‍රධාන පිරිපහදු ජල සම්ප්‍රේෂණ පද්ධතියේ කොටස් අංක | රජයට අතිරේක පිරිවැයක් දැරීමට සිදු විය හැක. | ප්‍රධාන පිරිපහදු ජල සම්ප්‍රේෂණ කොන්ත්‍රාත්තුව සඳහා වන කාල දිගුව පහත කරුණු සැලකිල්ලට ගෙන ලබා දෙන ලදි. | ව්‍යාපෘති කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |

01 සඳහා පයිප්ප සැපයීම හා එලීමේ කොන්ත්‍රාත්තුව 2018 ජුලි වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. සමස්ත නල එලීම් කාර්යය අවසන් කර තිබුණ ද, මීසාලෛ හා නල්ලූර්වල ජල ගබඩා දෙකෙහි ඉදි කිරීම් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වුවද, 2018 අගෝස්තු සිට 2020 සැප්තැම්බර් දක්වා වූ කාල සීමාව තුළ ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කිරීම අවස්ථා 9ක් ලබා දී තිබුණි.

| කාලදිගු වාර ගණන | කාල දිගුව සාධාරණීය කිරීම. |
|---|---|
| පළමු | 1. ඉඩම් සම්බන්ධ ගැටළුවක් නිසා නල්ලූර් ජල ගබඩා වැඩ බිමෙහි කටයුතු ප්‍රමාද වීම.<br>2. මෝටර් ෂෙල් අහඹු ලෙස හමුවීම.<br>3. කයිතායි පාලම හා නාවත්කුලි හි නල එලීම් මාර්ග වෙනස් වීම. |
| දෙවන | 1. වැඩ නිම කිරීම සඳහා පුහුණු හා නුපුහුණු කම්කරුවන්ගේ හිඟය |
| තුන්වන | 1. අධික වර්ෂාව නිසා ඉතිරි නල එලීම් ස්ථාන ජලයෙන් යටවීම.<br>අධික වර්ෂාවට පසු ජලයෙන් යට වු ප්‍රදේශවල වැල්ව් චැම්බර් එලීම ප්‍රමාද විම.<br>2. මාර්ග සංවර්ධන අධිකාරියේ සීමා කිරීම් නිසා කයිතාඩි හා නාවත්කුලි පාලම්වල බීම් සිටුවීම ප්‍රමාද වීම.<br>3. විශාල හුණු ගල් පරයක් නිසා නල එලීම ප්‍රමාද වීම. |
| හතරවැනි | 1. 2019 අප්‍රේල් 21 දින පාස්කු ප්‍රහාරය හා ඇඳිරි නීතිය දැමීම නිසා වැඩ කටයුතු ප්‍රමාද වීම.<br>දෛනිකව අවශ්‍යවන වන ඒබීසී හා කොරිඩස්ට් යන අමු ද්‍රව්‍ය ලබා ගැනීමේදී කොන්ත්‍රාත්කරු දුෂ්කරතාවලට මුහුණ දීම (මාර්ග වෙනස්වීම හා ආර්ඩීඒ අවශ්‍යතා අනුව)<br>2. ඩීසල් හා එන්ජින් කාමරවල සිදු කළ වෙනස්වීම. |

| | |
|---|---|
| පස්වැනි | 1. ආර්ඩීඒ හඳුන්වා දුන් කයිතාඩි හා නාවත්කුලි යන නව පාලම් දෙකෙහි විස්තර පහත දැක්වේ.<br>- 2016 නොවැම්බර් මස කොන්ත්‍රාත් ආරම්භ කළ අතර 2018 අගෝස්තු මස නිම කරන ලදී. දෝෂ හඳුනා ගැනීමේ කාලය 2019 අගෝස්තු දක්වා වේ.<br>- එමෙන්ම A09 මාර්ගය හරහා විවෘත කාණු කැපීමට ආර්ඩීඒ අවසර නොදීම නිසා 2019 ජුනි 17 දින පැවති සාකච්ඡාවට අනුව මහජනතාවට ඇතිවන අවහිරතා අඩු කර ගැනීම සහ අනාගත නඩත්තු කටයුතු වෙනුවෙන් සිමෙන්ති ආවරණ තුළින් නල එලීම (Pre - cost box culvert type) හඳුන්වා දෙන ලදී. |
| හයවැනි | වැඩ කරන ප්‍රදේශය ජලයෙන් යට වීම නිසා පොළව යට නළ එලීම් දුෂ්කර වීම. |
| හත්වැනි | 1. දේශීය අරමුදල් ගෙවීම ප්‍රමාද වීම.<br>2. නළ එලීම් සිදු කරන පහත් වැඩ බිම් ප්‍රදේශ ජලයෙන් යටවීම නිසා පොළව යට නල එලීම දුෂ්කර වීම. |
| අටවැනි හා නවවැනි | 1. කොන්ත්‍රාත් කොන්දේසි වගන්ති 8.4ට අනුව ලෝක සෞඛ්‍ය සංවිධානය (ඩබ්එච්ඕ) විසින් වසංගත තත්වයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) නිසා කාර්යයන් ප්‍රමාද විය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ව්‍යාපෘතියේ කටයුතු නිම නොවුණ ද, ණය ආපසු ගෙවීම් 2017 වර්ෂයේ සිට ආරම්භ වී තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, 2019 දෙසැම්බර් 31 වන විට එකතුව රු.මිලියන 497.20 ක් ණය ආපසු ගෙවීම් ලෙස ණය නියෝජිතායතනයට ගෙවා තිබුණි. | සැලසුම්කල පරිදි සංවර්ධන කටයුතු මෙහෙය වීමේදී රජයට ගැටළුවලට මුහුණ දීමට සිදු වේ. | ආසියානු සංවර්ධන බැංකුව, ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, අමාත්‍යාංශය, ඒඩීබී මෙහෙයුම් නිරීක්ෂණය (ADB Mission Visits) ඇතුළු විවිධ මට්ටම්වලදී ක්‍රමිකව යාවත්කාලීන කරයි. ඒඩීබී විසින් අද දක්වා වූ ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ මනා අවධානයක් දක්වයි. අත්සන් කරන ලද ණය ගිවිසුම හා අනුකූලවීම සඳහා ඒඩීබී විසින් ව්‍යාපෘති මූල්‍යනය වෙනුවෙන් බැදීම් ගාස්තු හා පොලී ගාස්තු අයකරයි. කෙසේ වුවද, අදාල ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය හා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතයාතනය විසින් මෙම පොලී හා බැදීම් ගාස්තු පිළිබද ආසියානු සංවර්ධන බැංකුව සමඟ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් කඩිනමින් සාකච්ඡාවක් කරනු ඇත. | ව්‍යාපෘති කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ඈ)2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති කාර්යය නිම කිරීමට සැලසුම් කර තිබුණ ද යාපනය දිස්ත්‍රික්කයේ නිම කරන ලද විවිධ ඉදි කිරීම්වලට අදාල ඉඩම්වල හිමිකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා නොතිබුණි. | ඉඩම්වල හිමිකම පැවරීම ප්‍රමාද වීම ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වීම කෙරෙහි බලපෑ හැක. | කරවඩි හා පුන්කුඩුතිවු හැර ඉදි කිරීම් කටයුතු දැනටමත් නිම වී ඇති ඉඩම්වල හිමිකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ඇත. පුන්කුඩුතිවු වල ඉදි කිරීම් නිම වී ඇති අතර ඉඩමට ප්‍රවේශ වීමේ ගැටළු හා අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිම වී නොමැති නිසා ඉඩම් හිමිකරුට වන්දි ගෙවීම් සිදු කර නොමැත.<br><br>කරවඩිහි ජල කුළුණු ඉදි කිරීම් කටයුතු කෙරෙමින් පවතින අතර, මෙම වර්ෂය අවසානයේ ඉදිකිරීම් නිමවීමට පෙර හිමිකම් නියෝගය ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබාදිය හැක. (අත්පත් කර ගැනීම අවසන් අදියරේ පැවතීම, ඡේද 17)<br>මලාපවහන පොම්ප කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම සිදු කරන ඉතිරි ඉඩමෙහි, අත්පත් කර ගැනීම් කටයුතු කෙරෙමින් පවතී. මලාපවහන පොම්ප කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම් ඇරඹීමට පෙර, අත්පත් කර ගැනීම් කටයුතු නිම කර හිමිකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පැවරිය හැක. | තවදුරටත් ප්‍රමාද නොවී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉඩම්වල හිමිකම ලබා ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ කරුණු**

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (ආ) | 2016 මාර්තු 24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 හි 2.3.2 ඡේදය පරිදි ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂක පූර්ණ කාලීනව සේවයේ යෙදවිය යුතුය. කෙසේ වුවද, ඉහත සඳහන් විධිවිධානවලට පටහැනිව මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, උතුරු ප්‍රදේශයේ අතිරේක සාමාන්‍යාධිකාරීගේ රාජකාරි ආවරණය සඳහා 2018 අප්‍රේල් සිට ද, විදුලිබල සැපයුම් විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය සඳහා 2019 දෙසැම්බර් සිට ද පත් කර තිබුණි. | ව්‍යාපෘතියේ කාර්යන්හි අධීක්ෂණ යාන්ත්‍රණය දුර්වල වනු ඇත. | ව්‍යාපෘති අධ්‍යක්ෂක හැකි සෑම විටම සමාන්‍යයෙන් සතිඅන්ත දින ඇතුළුව සතියේ බොහෝ දින ගණක් මෙම ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වැය කරයි. තවද, කළමනාකරණය විසින් සුමට ක්‍රියාකාරකම් සහ කාර්යයක්ෂම කළමනාකරණයක් ඇති කිරීම සඳහා ව්‍යාපෘති කාර්යය මණ්ඩලය අතර විශේෂිත තාක්ෂණික නියෝජනයක් පිළියෙල කර ඇත. තවද, උපකාරක සේවා මධ්‍යස්ථානය හා යාපනයේ, ජේකේඩබ්ජ්ස්ජ්ස්පී - පීඑම්අයිසීයු අතර යාවත්කාලීන වූ කාර්යක්ෂම තොරතුරු තාක්ෂණවේදයක් හා සන්නිවේදනයන් ක්‍රියාත්මක වේ. | ව්‍යාපෘති කාර්ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ වගකීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ පූර්ණ කාලීනව සේවයේ යෙදිය යුතුය. |